# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/4 - 2014 අප්‍රේල් මස 22 වැනි අඟහරුවාදා - 2014.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම් කොටස නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වහාම අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්. එකී ඉඩම් කොටස අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ, අංක 20 දරන කොටුව කොට්ඨාසය තුළ පිහිටි මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද 2006.08.08 දිනැති අංක Co/Col/UDA/2006/208 දරන අනුරේඛණයේ කැබලි අංක 26 (කොටසක්) ලෙස නිරූපිත ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 0 පර්චස් 30ක් පමණ වූ පහත සඳහන් මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 25 ; |
| නැගෙනහිරට | : | රෝහල් පටුමග ; |
| දකුණට | : | කැබලි අංක 26 (කොටසක්) ලෙස නිරූපිත රේණුකා ගොඩනැගිල්ල ; |
| බටහිරට | : | ජනාධිපති මාවත. |

02 - 132

1A - G 19423 — 65 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*